# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2311/29 - 2022 දෙසැම්බර් මස 21 වැනි බදාදා - 2022.12.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III වැනි කොටස - ඉඩම්

### ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ශුද්ධි පත්‍රිකාව**

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය*: J/DS/2/9/4/15-2015.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* : 4 -3/15/2015/VE/256.

අංක 2303/14 හා 2022.10.26 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ ප්‍රකාශයෙහි ඉඩමේ විස්තරයෙහි ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2023.03.21 වැනි දින පෙ.ව. 10.00 ට උඩුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2023.03.08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම්/ පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත් වන්දි මුදල් හා ඒ මුදල් ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එස්. සුතර්සන්,
ප්‍රාදේශීය ලේකම්,
යාපනය.

2022 දෙසැම්බර් මස 9 වැනි දින,
යාපනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

EOG 12-0129



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය*: AKU/LAN/06/LA106.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/13/2019/PC/532.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/ පරවශතාවේ විස්තර :

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ අකුරුස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අකුරුස්ස ගමේ පිහිටි සර්වේ ජනරාල්ගේ අ.ග.පි. 551 අතිරේක අංක 09 හා පත්‍ර අංක 13 දරන අවසාන ගම් පිඹුරේ පෙන්නුම් කරන පහත දැක්වෙන ඉඩම් කොටස්

01. කැබලි අංක 225
ඉඩමේ නම: කොරහනකැලේ *හෙවත්* කිවුල්දෙනිය මූකලාන; ප්‍රමාණය: හෙක්ටයාර 0.0506 ක්.

*උතුරට* : කැබලි අංක 224; *නැගෙනහිරට* : කැබලි අංක 44AB සහ 50; *දකුණට* : කැබලි අංක 44 AB, 50, 50 1/4 සහ 44L; *බටහිරට* : කැබලි අංක 44 L සහ 224.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් පහත සඳහන් දිනයන්හිදී අකුරුස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

දිනය 2023.03.06
වෙලාව පෙ.ව. 10.00
කැබලි අංකය 225

තව ද, 2023.02.25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති සියළු ඔප්පු තිරප්පු හා වෙනත් ලියවිලි විභාගයට ඉදිරිපත් කළ යුතුය.

කේ. ජී. ඩී. අනෝජා,
ප්‍රාදේශීය ලේකම්,
අකුරුස්ස.

2022 දෙසැම්බර් මස 19 වැනි දින,
අකුරුස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

EOG 12-0272

---

## ශුද්ධි පත්‍රිකාව

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: KDS/KGK/3/2/2011/02/LA.
*ඉ. හා සංචාරක අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/7/2011/ HW/84.

උක්ත ශීර්ෂ යටතේ 2013 අගෝස්තු මස 05 වෙනි දින හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1822/3 දරන අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* පල කරන ලද ඉහත සඳහන් දැන්වීමෙහි සඳහන් මෙහි පහත දැක්වෙන I ජේදයේ සඳහන් කොටස ඉවත් කොට ඒ වෙනුවට මෙහි II ජේදයේ දැක්වෙන කොටස් ආදේශ කොට එම දැන්වීම සංශෝධනය කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

I ජේදය
ඉවත් කළ යුතු කොටස
මූ.පි. මහ 6233 හි;

කැබලි අංක 225
ඉඩමේ නම: මීගස්අංග, වරිපනම් අංක 489, විලියම්ගොපල්ලව මාවත; හිමිකම් කියන්නා: එස්. එච්. වීරකෝන්; ප්‍රමාණය: හෙක්ටයාර 0.0709.

*උතුරට* : විලියම් ගොපල්ලව මාවත සහ කැබලි අංක 224; *නැගෙනහිරට* : කැබලි අංක 223, ඩබ්.එම්.ආර්. වනිගරත්න හිමිකම් කියන විලියම් ගොපල්ලව මාවතේ වරිපනම් අංක 483 B සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; *දකුණට* : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ මැද ඇළ; *බටහිරට* : මැද ඇළ සහ විලියම්ගොපල්ලව මාවත.

II ජේදය
ආදේශ කළ යුතු කොටස්
මූ.පි. මහ 6233 හි;

කැබලි අංක 243
ඉඩමේ නම: - ; වර්තමාන ඉඩම් පරිහරණය: මාර්ගය ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර 0.0480.

කැබලි අංක 244
ඉඩමේ නම: මීගස්අංග, වරිපනම් අංක 489, විලියම්ගොපල්ලව මාවත; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: එච්. එස්. වීරකෝන්; ප්‍රමාණය: හෙක්ටයාර 0.0229.

යූ. ජේ. එම්. එස්. බී. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත්සතර මහ ගඟවට කෝරලය.

2022 දෙසැම්බර් මස 14 වැනි දින,
මහනුවර කඩවත්සතර හා ගඟවට කෝරළය,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

EOG 12-0273

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.